## දුම්රිය මැදිරි වෙන්කිරීමේ ගාස්තු (කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වන දුම්රියන් වල හැර)

කොළඹ කොටුව සිට බදුල්ල දක්වා ධාවනය වන දුම්රියන් වල හැර, අනෙක් මාර්ගවල ධාවනය වන දුම්රියන් වල වෙන්නොකරනලද ආසන සහිත මැදිරි වෙන්කිරීමේදී අයකරන ගාස්තු පහතින් දැක්වේ.කවද මෙම ඉල්ලීම ගමන යෝජිත දිනට අවම සති 03 කට පෙරවත් ඉල්ලීම කලයුතුය.

| පංතිය | සම්පූර්ණ මැදිරියක් සඳහා 1 Km ට ගාස්තුව ( රු.) | මැදිරියකින් අඩක් සඳහා 1 Km ට ගාස්තුව ( රු.) |
|---|---|---|
| පළමු ( 1 st ) | - | - |
| දෙවන ( 2 nd ) | 800.00 | 400.00 |
| තෙවන ( 3 rd ) | 800.00 | 400.00 |

- මැදිරියකින් අඩක් වෙන්කරනුයේ ඒ සඳහා එම පහසුකම ලබාදියහැකි දුම්රියන් වල පමණි.

ගාස්තු ගණනයේදී දුම්රිය ගමන් ආරම්භ කරන දුම්රිය ස්ථානයේ සිට ඉල්ලුම්කරු විසින් ගමන් අවසන් කරන දුම්රිය ස්ථානය දක්වා දුර ඉහත ගාස්තුවෙන් වැඩිකර එයට 18% වැට් මුදල් හා දුම්රිය ආරක්ෂක ගාස්තු හා ඇප තැන්පතු මුදල් එකතු කර සකස්කරනු ලබයි.මෙහිදී අවම දුර 100 Km ක් ලෙස සලකා ගාස්තු ගණනය කරනු ලබයි.ගාස්තු සැකැස්ම පහත පරිදි වේ.

| | |
|---|---|
| ගාස්තුව | = රු. xxxx.xx |
| 18% වැට් මුදල | = රු .xxxx.xx |
| දුම්රිය ආරක්ෂක ගාස්තු (යාමට ) | = රු. 5,000.00 |
| ඇප තැන්පතු මුදල | = රු. 25,000.00 |
| සම්පූර්ණ මුදල | = රු. xx,xxx.xx |

ඉහත සඳහන් දුම්රිය මැදිරි වෙන්කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු,නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) කාර්යාලයේ **011- 4600156** යන දුරකථන අංකයට ඇමතුමක් ලබාදී දැනගත හැක.

## <u>විශේෂ දුම්රිය වෙන්කිරීමේ ගාස්තු</u>

විශේෂ දුම්රිය වෙන්කිරීමේදී අයකරන ගාස්තු,ධාවනය කරන දින ගණන,මැදිරි ප්‍රමාණය,ඩීසල් මිල හා දුම්රිය වර්ගය අනුව වෙනස් වේ.එබැවින් ප්‍රථමයෙන් ගමන යෝජිත දිනට අවම දින 30 කට පෙරවත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) කාර්යාලය වෙත ලිඛිතව ඉල්ලීම කල යුතුය.ඉන්පසුව ඒ සඳහා විශේෂ දුම්රියක් ලබාදිය හැකිද යන්න පරීක්ෂා කිරීමෙන් අනතරුව ලබාදියහැකි නම් අදාල ගාස්තු ලිපියකින් දැනුම්දෙනු ලැබේ.ගාස්තු ගෙවීමෙන් අනතුරුව අදාල වෙන්කිරීම සිදුකරනු ලබයි.

ඉහත සඳහන් විශේෂ දුම්රිය වෙන්කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු,නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ) කාර්යාලයේ **011- 4600156** යන දුරකථන අංකයට ඇමතුමක් ලබාදී දැනගත හැක.